සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018
# පුරවැසි අධ්‍යාපනය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ,
(1) එය ජනතා කැමැත්ත මත සිදුවන නිසාය.
(2) ආණ්ඩු බලය වැඩි නියෝජිතයන් සංඛ්‍යාවක් පත් වූ දේශපාලන පක්ෂයට හිමි වන නිසාය.
(3) එය සමානාත්මතාව ගරු කරන නිසාය.
(4) නීති සම්පාදනය ජනතා නියෝජිතයන් මගින් සිදුකරන නිසාය.

02. බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල් 02 ක් අඩංගු පිළිතුරු තෝරන්න.
(1) ශ්‍රී ලංකාව හා මහා බ්‍රිතාන්‍ය (2) ඉන්දියාව හා ඇමරිකාව
(3) ඉන්දියාව හා මහා බ්‍රිතාන්‍ය (4) ශ්‍රී ලංකාව හා ඉන්දියාව

03. මැතිවරණ මගින් පාලන ආයතන සඳහා නියෝජිතයන් තෝරා පත්කර ගැනීම,
(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක මූලික ලක්ෂණයකි. (2) සමාජවාදී පාලනයක මූලික ලක්ෂණයකි.
(3) පැසිස්වාදී පාලනයක මූලික ලක්ෂණයකි. (4) ඒකාධිපතිවාදී පාලනයක මූලික ලක්ෂණයකි.

04. ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයක් වන්නේ,
(1) ආණ්ඩු පක්ෂයේ කටයුතු විවේචනය කිරීම.
(2) ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් පිළිබඳව නිතර සොයා බලා එහි කටයුතු විවේචනය කිරීම.
(3) ආණ්ඩු පක්ෂයේ කටයුතු පිළිබඳව සංවර්ධනාත්මකව විවේචන ඉදිරිපත් කිරීම.
(4) ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ප්‍රතිපත්ති පිළිබඳව සැලකිලිමත් නොවීම.

05. මිනිසකු ලෙස ගරුත්වයෙන් යුතුව සමාජයේ ජීවත්වීම සඳහා ඔහුට උපතින්ම ලැබෙන අයිතිවාසිකම් වන්නේ,
(1) මූලික අයිතිවාසිකම් වේ. (2) මානව අයිතිවාසිකම් වේ.
(3) සාමාජීය අයිතිවාසිකම් වේ. (4) සිවිල් අයිතිවාසිකම් වේ.

06. නීති පැනවීමටත් එම නීති වලට ජනතාවගේ අවනතභාවය ලබාගැනීමටත් ආධාරවන්නේ,
(1) රාජ්‍ය සතු විධායක බලයයි. (2) රාජ්‍ය සතු ස්වාධිපති බලයයි.
(3) රාජ්‍ය සතු පරමාධිපත්‍ය බලයයි. (4) රාජ්‍ය සතු ව්‍යවස්ථාදායක බලයයි.

07. මැතිවරණයකදී ජනතාවට හිතකර ආණ්ඩුවක් බලයට පත්කර ගැනීම,
(1) ජනතාවගේ වගකීමකි. (2) ඡන්දදායකයාගේ වගකීමකි.
(3) දේශපාලන පක්ෂවල වගකීමකි. (4) සිවිල් සමාජයේ වගකීමකි.

08. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සාමකාමී ජන සමාජයක් ගොඩනැගීම සඳහා හේතුවන කරුණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) සුළුතර අදහස් නොසලකා හැරීම.
(2) බහුතර මතයට ගරු කිරීම.
(3) පුරවැසියන්ට සිය අදහස් ප්‍රකාශ කිරීම සීමා කිරීම.
(4) පාලකයන්ට අවශ්‍ය නීති සම්පාදනයට ඉඩ සැලසීම.

09. බලය විමධ්‍යගත කිරීමේදී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,
    (1) ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනතක් මගින් එය සිදු කිරීම.
    (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බලය බෙදා දැක්වීම.
    (3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බලය පැවරීම.
    (4) ප්‍රාදේශීය පාලන ඒකක වලට බලය පැවරීම.

10. සංධීය රාජ්‍ය වල නව ප්‍රවණතාවයන් වන්නේ,
    (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රාන්ත රාජ්‍යවලට වැඩි වාසි සැලසෙන ලෙස අර්ථ දැක්වීම.
    (2) රාජ්‍ය සුභසාධන කාර්යයන් වල වගකීම ප්‍රාන්ත රාජ්‍ය වලටම දරා ගැනීමට සිදුවීම.
    (3) දෙවන ලෝක යුද්ධයෙන් පසු අන්තර් ජාතික ක්ෂේත්‍රය තුළ ඇතිවී තිබෙන වෙනස නිසා මධ්‍යම ආණ්ඩුවේ බලය වැඩිවීම.
    (4) මූල්‍ය ගණුදෙනු වලදී ප්‍රාන්ත රාජ්‍ය වලට වඩා, වැඩි වැදගත්කමක් ලබාදීම.

11. පළාත් සභාවක පළාත් ආණ්ඩුකරු පත්කරනු ලබන්නේ,
    (1) මහඇමති විසිනි. (2) ජනාධිපති විසිනි. (3) අමාත්‍ය මණ්ඩලය විසිනි. (4) ජනතාව විසිනි.

12. ජාතික නිවාස හා ඉදිකිරීම් කටයුතු සිදුකිරීම,
    (1) පළාත් සභාවක පළාත් සභා ලැයිස්තුවට අයත් බලයකි.
    (2) පළාත් සභාවක සංවෘත ලැයිස්තුවට අයත් බලයකි.
    (3) පළාත් සභාවක සමගාමී ලැයිස්තුවට අයත් බලයකි.
    (4) පළාත් සභාවක පළාත් පාලන ලැයිස්තුවට අයත් බලයකි.

13. පළාත් පාලන ආයතනයක මහාසභාව මගින් ඉටුකරන ප්‍රධාන කාර්යයන් වන්නේ,
    (1) පළාත් පාලන ආයතනයට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමයි.
    (2) මහජන උපයෝගීතා සේවා සැපයීමයි.
    (3) සභාව කැඳවීම හා කල්තැබීමේ කාර්යයයි.
    (4) අයවැය ලේඛනය සැලසුම් කිරීම හා ඉදිරිපත් කිරීමයි.

- **පහත ප්‍රකාශන කියවා 14 හා 15 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| A - මූල්‍ය කටයුතු | B - අධ්‍යාපන කටයුතු |
| C - ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාම | D - සෞඛ්‍ය කටයුතු |
| E - පළාත් පාලනය, මහාමාර්ග කටයුතු | F - ජාතික ආර්ථිකය සංවර්ධනය |

14. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල ඇතුළත් පිළිතුරු කාණ්ඩය වනුයේ,
    (1) ABC (2) BCD (3) ACF (4) DGF

15. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල වන්නේ,
    (1) ABC (2) ACD (3) BDE (4) DEF

16. සංස්කෘතිය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ දේශපාලන දාර්ශනිකයන් දෙදෙනෙක් අඩංගු පිළිතුර තෝරන්න.
    (1) ටී.බී. ටයිලර්, ජී.ඩී.එච්. කෝල් (2) ජී.ඩී.එච්. කෝල්, ඊටී හිලර්
    (3) ටී.බී. ටයිලර්, ඊටී හිලර් (4) චාර්ලස් ඒ එල්වුඩ්, මහාචාර්ය ගානර්

17. ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජයක් දැකිය හැකි රාජ්‍ය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) ඉන්දියාව, ඇමරිකාව (2) ඉන්දියාව, ලංකාව (3) ලංකාව. ඇමරිකාව (4) ඇමරිකාව, බ්‍රිතාන්‍ය

18. නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් නිවැරදිව අඩංගු පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1. භූමිය | A වැටුප් |
| 2. ශ්‍රමය | B බදුකුලී |
| 3. ප්‍රාග්ධනය | C ලාභ |
| 4. ව්‍යවසායකත්වය | D පොලී |

    (1) ABCD (2) BADC (3) DACB (4) CBAD

19. නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා දක්වා ලබාදීමේ ක්‍රියාවලිය,
(1) අලෙවි කිරීම නම් වේ (2) බෙදා හැරීම නම් වේ
(3) සිල්ලර වෙළඳාම නම් වේ (4) තොග වෙළඳාම නම් වේ

20. වෙළඳපල ආර්ථිකය ලෙස වර්තමානයේදී ක්‍රියාත්මක වන ආර්ථික ක්‍රමය,
(1) ලිබරල්වාදී ආර්ථික ක්‍රමය ලෙස හඳුන්වයි. (2) ධනවාදී ආර්ථික ක්‍රමය ලෙස හඳුන්වයි.
(3) නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය ලෙස හඳුන්වයි. (4) නව ධනවාදී ආර්ථික ක්‍රමය ලෙස හඳුන්වයි.

21. සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය 2000 වර්ෂයේ දී පැවැත්වූ සහශ්‍රක සමුළුවේදී සම්මත කරගත් සංවර්ධන ඉලක්කයන් වන්නේ,
(1) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා පුරුෂයා බලවත් කිරීම
(2) ඒඩ්ස් මැලේරියා රෝග වර්ධනය කිරීම
(3) සාගින්න පමණක් තුරන් කිරීමට කටයුතු කිරීම
(4) පාරිසරික තිරසර බව සුරක්ෂිත කිරීම

22. ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයන් අඩංගු පිළිතුර තෝරන්න.
(1) වැඩ ලෝකය වඩාත් පටුවීම.
(2) සාමාජීය වශයෙන් නොව භූගෝලීය වශයෙන් මිනිසුන් සමීප වීම.
(3) ලෝකයේ ඕනෑම රටක ජීවත්විය හැකිවීම.
(4) තම දක්ෂතා හැකියා අනුව තමන්ගේ රටේ පමණක් සේවය කළ හැකිවීම.

23. වාර්ගික, ආගමික, කුලගෝත්‍ර අතර විවිධ පරස්පරතා මතභේද නිසා ඇතිවන ගැටළු හඳුන්වන්නේ,
(1) පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇතිවන ගැටුම් ලෙසය.
(2) රටවල් කිහිපයක් අතර ඇතිවන ගැටුම් ලෙසය.
(3) පුද්ගල ගැටුමක් ලෙසය.
(4) පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ගැටුම් ලෙසය.

24. අන්තර් ජාතික ගැටුම්වල අවසාන ප්‍රතිඵලය වන්නේ,
(1) ජාතීන් අතර මිත්‍රත්වය වර්ධනය වීමය.
(2) ද්වීපාර්ශවීය ගිවිසුම් වලට එළඹීමයි.
(3) අන්තර් ජාතික වශනේ සාමය සාමය ආරම්භයට මග පෑදීමයි.
(4) අන්තර් ජාතික සම්බන්ධතා බිඳවැටීමයි.

25. ගැටුමත් ප්‍රජාතන්ත්‍රවාදීව නිරාකරණය කිරීම යන්නෙන් අදහස් කරන්නේ,
(1) ගැටුමට ලක්වී ඇති පුද්ගලයන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් තීරණ තීන්දු ගැනීමයි.
(2) ගැටුම් පාර්ශව දෙකටම ජය - ජය විසඳුම් ලඟා කිරීම වේ.
(3) තුන්වන පාර්ශවයක උදව්වෙන් ගැටුම් නිරාකරණය කරගැනීමයි.
(4) ගැටුම අධිකරණය වෙත හෝ බලයන් සහිත ආයතනයකට යොමු කරමින් විසඳවා ගැනීම වේ.

26. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය වන්නේ,
(1) සිවිල් නීතියයි. (2) අපරාධ නීතියයි. (3) රෝම ලන්දේසි නීතියයි. (4) පරිපාලන නීතියයි.

27. ''භූමියේ චාරිත්‍රය'' යන අර්ථය අඩංගු නීතිය හඳුන්වන්නේ,
(1) මුස්ලිම් නීතිය ලෙසයි. (2) උඩරට නීතිය ලෙසයි.
(3) තේසවලාමේ නීතිය ලෙසයි. (4) පහතරට නීතිය ලෙසයි.

28. වාණිජ ආරවුල් විසඳීමේ බලය ලබාදී ඇත්තේ,
(1) ශ්‍රේෂ්ඨාධිකරණයටයි. (2) අභියාචනාධිකරණයටයි.
(3) මහාධිකරණයටයි. (4) පළාත්බද මහාධිකරණයටයි.

29. මානව හිමිකම් කොමිසමේ ප්‍රධාන කාර්යයක් වන්නේ,
(1) මූලික අයිතිවාසිකම් පිළිබඳව පමණක් ජනතාව දැනුවත් කිරීම.
(2) මානව හිමිකම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
(3) ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරන පාලකයන්ට දඬුවම් පැමිණවීම.
(4) ජනතා අයිතිවාසිකම් සම්බන්ධව රජය ගන්නා ඕනෑම ක්‍රියාමාර්ගයකට අවනත වීම.

30. අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම මගින්,
(1) නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට පැමිණේ.
(2) රට තුළ සිදුවන අපරාධ හා දූෂණ මර්ධනය වේ.
(3) යුක්තිය ඉටුකර ගැනීම සඳහා අනියම් ක්‍රම භාවිතා කිරීමට හුරුවේ.
(4) මිනිසුන් තුළ නීතියට ඇති ගෞරවය හීන වේ.

31. ලංකාවට ප්‍රථම වරට සීමිත ඡන්ද බලය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,
(1) කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි.
(2) කෲ මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි.
(3) මැනිං ඩෙවන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි.
(4) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි.

32. ලංකාවට සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,
(1) කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි.
(2) කෲ මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි.
(3) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි.
(4) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි.

33. ලංකාව ස්වාධීන ස්වෛරී ජනරජයක් බවට පත්වූයේ,
(1) 1948 වර්ෂයේදී ය. (2) 1972 වර්ෂයේදී ය. (3) 1978 වර්ෂයේදී ය. (4) 1982 වර්ෂයේදී ය.

34. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හැඳින්වූ නිල නාමය වන්නේ,
(1) රාජ්‍ය මන්ත්‍රන සභාව නමිනි. (2) ජාතික රාජ්‍ය සභාව නමිනි.
(3) පාර්ලිමේන්තුව නමිනි. (4) මහජන මන්ත්‍රී මණ්ඩලය නමිනි.

35. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) ළමයින්ට අවශ්‍ය උපරිම නිදහස ලබාදීමයි.
(2) විදේශ අධ්‍යාපනය නොමිලේ ලබාදීම.
(3) සෑම අවස්ථාවකදීම ''ළමයාගේ උපරිම යහපත'' වෙනුවෙන් කටයුතු කිරීම.
(4) ළමයින් සම්බන්ධව ක්‍රියාකිරීමේ බලය පොලීසියට බාර කිරීම.

36. වැඩකරන ජනතාව වෙනුවෙන් සමාජ සාධාරණත්වය ඉටුකිරීම සඳහා පිහිටුවාගෙන ඇති සංවිධානය වන්නේ,
(1) ලංකා කම්කරු සංවිධානය (2) අන්තර් ජාතික කම්කරු සංවිධානය
(3) අන්තර් ජාතික රතුකුරුස සංවිධානය (4) අන්තර් ජාතික මානව හිමිකම් සංවිධානය

37. පාරිසරික ගැටළු අවමකර ගැනීම සඳහා ඔබට කල හැකි කාර්යයක් වන්නේ,
(1) අධි පරිභෝජනයට හැකිතාක් යොමුවීම.
(2) පෘථිවි අභ්‍යන්තරයේ ඇති ඛනිජ ලබාගෙන සංවර්ධනයට මුදාහැරීම.
(3) කසල වර්ගීකරණය කර ක්‍රමානුකූලව බැහැර කිරීම.
(4) ස්වාභාවික වනාන්තර එළිපෙහෙළිකර වගාවන් ඇතිකිරීම.

38. වන හායනය නිසා සිදුවී ඇති අහිතකර ප්‍රතිඵලයක් වන්නේ,
(1) ගංවතුර හා නායයාම් සීමාවීම. (2) පාංශු තෙතමනය ඉවත්වීම.
(3) පාංශු ඛාදනය අඩුවීම. (4) භූගත ජල මට්ටම් ප්‍රමාණාත්මකව ඉහළ යාම.

39. දකුණු හා අග්නිදිග ආසියානු රටවල ආර්ථික හා සමාජ අභිවෘද්ධිය උදෙසා ඇතිකර ගන්නා ලද සාමූහික සැලැස්ම වන්නේ,
(1) ආසියාන් සංවිධානයයි. (2) සාක් සංවිධානයයි.
(3) කොළඹ ක්‍රමයයි. (4) ආසියානු සංවර්ධන සැලැස්මයි.

40. පහත ප්‍රකාශ කියවා ලෝක ආහාර වැඩසටහනට (WFP) අදාළ අරමුණු දෙකක් තෝරා ලකුණු කරන්න.

A - හදිසි ආපදා වලදී විපතට පත්වූවන්ට උපකාර කිරීම.
B - සරණාගතයන්ට මානුෂවාදී සහන සැලසීම.
C - සංවර්ධනය වන රටවලට සහායවීම.
D - සාගින්න හා දරිද්‍රතාව පිටුදැකීම.

(1) AB (2) BC (3) AD (4) AC

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය - II

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) i. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ 02 ලියන්න.

ii. නූතන රාජ්‍යවල බලයේ විවිධ ස්වරූප 02 ක් ලියන්න.

iii. බහු සංස්කෘතික සමාජයක දැකිය හැකි මූලික ලක්ෂණ 02 ක් ලියන්න.

iv. භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ශිල්පක්‍රම 02 නම් කරන්න.

v. ජොහාන් ගැල්ටුංගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ අංග 02 ලියන්න.

vi. වර්තමාන රාජ්‍යවල ක්‍රියාත්මක වන නීතියේ මූලාශ්‍ර 02 ලියන්න.

vii. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ පාර්ලිමේන්තුවේ ද්විත්ව මණ්ඩල නම් කරන්න.

viii. මානව අයිතිවාසිකමේ දිනාගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා 02 ක් ලියන්න.

ix. මිනිසාට පරිසරයෙන් ලැබෙන සේවා 02 ලියන්න.

x. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන 02 ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) i. මිනිසා සතු නීතිමය යුතුකම් 02 ලියන්න. (ල.02)

ii. ආණ්ඩුවක් තම කටයුතු පවත්වාගෙන යාමේදී ජන සමාජයට ඉටුවිය යුතු වගකීම් 03 ක් ලියන්න. (ල.03)

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක 03 ක් ලියා එකක් විස්තර කරන්න. (ල.05)

(03) i. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීමට බලපාන හේතු 02 ලියන්න. (ල.02)

ii. බහු සංස්කෘතික ජන සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග 03 ක් ලියන්න. (ල.03)

iii. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් දක්වා එකක් විස්තර කරන්න. (ල.05)

(04) i. රටක අභ්‍යන්තර ගැටුම් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් 02 ලියන්න. (ල.02)

ii. ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම 03 ක් ලියන්න. (ල.03)

iii. ගැටුම් නිරාකරණය කිරීමේ වාසි 03 ක් ලියා එකක් විස්තර කරන්න. (ල.05)

(05) i. ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල 02 ක් ලියන්න. (ල.02)

ii. අධිකරණය හා සම්බන්ධ නීතිය ක්‍රියාවට නන්වන ප්‍රධානීන් තිදෙනා නම් කරන්න. (ල.03)

iii. වර්ථමාන රාජ්‍ය වල අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ගෙන ඇති පියවර 03 ක් ලියා එකක් විස්තර කරන්න. (ල.05)

(06) i. වර්තමාන රාජ්‍යවල ව්‍යවස්ථාදායකය සතු බලතල 02 ක් ලියන්න. (ල.02)

ii. වර්ථමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන 03 ලියන්න. (ල.03)

iii. පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන් බෙදා දැක්විය හැකි ප්‍රධාන තේමා තුන ලියා එකක් විස්තර කරන්න. (ල.05)

(07) i. මානව හිමිකම් බෙදෙන ප්‍රධාන කොටස් 02 නම් කරන්න. (ල.02)

ii. ළමා අයිතිවාසිකම් සුරැකීම විශේෂ අරමුණු 04 ක් පදනම් කරගෙන සිදුවේ. ඉන් 03 ක් ලියන්න. (ල.03)

iii. මූලික අයිතිවාසිකම් කඩකල විට ගත හැකි ක්‍රියාමාර්ග 03 ක් ලියා එකක් විස්තර කරන්න. (ල.05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(1) | 4 -(3) | 5 -(2) | 6 -(2) | 7 -(2) | 8 -(2) | 9 -(1) | 10 -(3) |
| 11 -(2) | 12 -(3) | 13 -(1) | 14 -(3) | 15 -(3) | 16 -(3) | 17 -(1) | 18 -(2) | 19 -(2) | 20 -(3) |
| 21 -(4) | 22 -(3) | 23 -(4) | 24 -(4) | 25 -(1) | 26 -(3) | 27 -(3) | 28 -(4) | 29 -(2) | 30 -(2) |
| 31 -(2) | 32 -(3) | 33 -(2) | 34 -(2) | 35 -(3) | 36 -(2) | 37 -(3) | 38 -(2) | 39 -(3) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. • ජනාධිපති විධායක බලය හැසිරවීම. • විධායකය ව්‍යවස්ථාදායකයට සෘජුවම වගනොවීම. • ජනාධිපති විධායකයේ නායකයා වීම - ආදී.....,

ii. • ආර්ථික බලය • දේශපාලන බලය • සමාජ බලය

iii. • විවිධ ජාතීන් එකට ජීවත් වීම • විවිධ සංස්කෘතීන් දක්නට ලැබීම • විවිධ ආගම් පැවතීම - ආදී වශයෙන්....,

iv. • ශ්‍රම සූක්ෂම • ප්‍රාග්ධන සූක්ෂම

v. • සන්ධර්භය • ආකල්ප • චර්යාව

vi. • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව • ආගම • සිරිත් විරිත් - ආදී වශයෙන්.....,

vii. • මහජන මන්ත්‍රී මණ්ඩලය • සෙනෙට් / උත්තර මන්ත්‍රී මණ්ඩලය

viii. • 1215 මැග්නා කාර්ටා ගිවිසුම • 1689 බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් පනත • 1917 රුසියානු විප්ලවය • 1776 - ඇමරිකානු නිදහස් සටන • 1789 - ප්‍රංශ විප්ලවය

ix. • ජීය උපකාරක සේවා • ආර්ථික උපකාර සේවා • අපද්‍රව්‍ය අවශෝෂන සේවා

x. • මහා මණ්ඩලය • ආර්ථික හා සමාජ මණ්ඩලය • භාරකාර මණ්ඩලය • ආරක්ෂක මණ්ඩලය - ආදී වශයෙන්.....

(ලකුණු 2 × 10 = 20)

(02) i. • නියමිත බදු ගෙවීම • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම • නීතියට ගරුකිරීම - ආදී වශයෙන්.... (ල.02)

ii. • නීතිය හා සාමය ආරක්ෂා කිරීම • සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම • පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම (ල.03)

iii. • නීතියේ ආධිපත්‍ය • අධිකරණයේ ස්වාධීනත්වය • ජනතාවගේ දේශපාලන අවබෝධය... (ල.05)

(03) i. • සංක්‍රමන • ආක්‍රමණ • පිහිටීම • ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම (ල.02)

ii. • අන්‍ය ආගම් වලට ගරුකිරීම • සාමුහිකත්වය වර්ධනය • අන්‍යමත ඉවසීම, සමානාත්මතාවය (ල.03)

iii. • එකිනෙකා අතර අවබෝධය පුලුල්වීම • එකිනෙකාට ගරුකිරීමට හුරුවේ • විනිවිධභාවයෙන් යුතුව කටයුතු කරයි. (තුනක් ලියා එකක් විස්තර කර තිබීම) (ල.05)

(04) i. • සාර්ව ගැටුම් • ක්ෂුද්‍ර ගැටුම් (ල.02)

ii. • සාකච්ඡාව • සහසම්මන්ත්‍රනය • කේවල් කිරීම • මැදහත්කරණය • සමතකරණය ආදී වශයෙන්.... (ල.03)

iii. • ජීවිත හානි වැලකීම • ආත්ම ගරුත්වය සුරැකීම • දේපල හානි වැලකීම • මානසික ආතතිය අවම වීම (ල.05)

(05) i. • අවසාන අභියාචනාධිකරණ බලතල • උපදේශාත්මක අධිකරණ බලය • රීති සැකසීමේ අධිකරණ බලය ආදී වශයෙන්..... (ල.02)

ii. • නීතිපති • අධිකරණ ඇමති • අග්‍රවිනිශ්චයකරු (ල.03)

iii. • විනිශ්චය කරුවන් පත්කිරීම • විනිශ්චයකරුවන් ඉවත්කිරීම • විනිශ්චයකරුවන්ගේ වැටුප් • වෙනත් තනතුරු පිළි නොගැනීම ආදීවශයෙන්...... (ල.05)

(06) i. • නීති සම්පාදනය • විධායකය පාලනය • අයවැය පාලනය (ල.02)

ii. • මහනගර සභා • නගරසභා • ප්‍රාදේශීය සභා (ල.03)

iii. • පොදු මංමාවත් • මහජන සෞඛ්‍ය • පොදු උපයෝගිතා සේවා (ල.05)

(07) i. • සිවිල් • දේශපාලන (ල.02)

ii. • පැවැත්ම • ආරක්ෂාව • සංවර්ධනය • සහභාගීත්වය (ල.03)

iii. • ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කිරීම. • මානව හිමිකම් කොමිෂම වෙත ඉදිරිපත් කිරීම. • ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැමිණිලි කිරීම ආදී වශයෙන්... (ල.05)